**රජයේ නිවේදන**

**1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත**

**3 වැනි වගන්තිය යටතේ නියමය**

සංශෝධිත පරිදි, 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල මුදල් අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මම, මෙම නියෝගය මඟින් මෙහි උපලේඛනයෙහි I, II හා III වන තීරුවල නිශ්චිතව සඳහන් කරනු ලැබ ඇති සෑම අනුරූපී භාණ්ඩයක් මතම, ඉහත පනතේ 3 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද 2020 අගෝස්තු මස 21 දිනැති අංක 2189/47 දරන අතිවිශෙෂ ගැසට් නිවේදනය මඟින් සංශෝධිත 2019 මාර්තු මස 05 දිනැති අංක 2113/9 දරන අතිවිශෙෂ ගැසට් නිවේදනයේ I වන උපලේඛනයෙහි අනුරූප භාණ්ඩ මත එම උපලේඛනයේ IV වැනි තීරුවෙහි නිශ්චිතව දක්වා ඇති බදු අනුප්‍රමාණයන් සඳහා, මෙහි උපලේඛනයෙහි IV වැනි තීරුවෙහි දක්වා ඇති නිෂ්පාදන බදු අනුප්‍රමාණයන් 2020 ඔක්තෝබර් ....13....... දින සිට ප්‍රතිස්ථාපනය විය යුතු බව, ප්‍රකාශයට පත් කරමි.

මහින්ද රාජපක්ෂ,
මුදල් අමාත්‍ය.

2020 ඔක්තෝබර් ...13....වැනි දින,
කොළඹ 01,
මුදල් අමාත්‍යාංශයේ දී ය.

**උපලේඛනය**

| සංයෝජිත වර්ගීකරණ ශීර්ෂය<br>I | සංයෝජිත වර්ගීකරණ සංකේතය<br>II | විස්තරය<br>III | නිෂ්පාදන බද්ද<br>IV |
|---|---|---|---|
| **22.02** | | **සීනි හෝ අනෙකුත් පැණිරස කාරක ද්‍රව්‍යයන් එකතු කරනු ලැබුවා වූ හෝ රස කළා වූ, ඛනිජ ජලය හා වායුව කවන ලද (එරේටඩ්) ජලය ඇතුළු ජල වර්ග හා ශීර්ෂ 20.09 හි සඳහන් පළතුරු හෝ එළවළු යුෂ අඩංගු නොවූ අනෙකුත් අමද්‍යපාන වර්ග** | |
| | 2202.10 | සීනි හෝ වෙනත් පැණිරස කාරක ද්‍රව්‍යයන් එකතුකරනු ලැබුවා වූ හෝ රසකළා වූ, ඛනිජ ජලය හා වායුව කවනු ලැබුවා වූ (එරේටඩ්) ජලය ඇතුළු ජල වර්ග | ලීටරයකට රු. 12/- හෝ නිෂ්පාදිතයේ අඩංගු සීනි, මිලි ලීටර 100 කට ග්‍රෑම් 6 ක් ඉවත් කරමින්, ග්‍රෑමයකට ශත 30/- යන දෙකෙන් වැඩි අගය |

| | | | |
|---|---|---|---|
| | 2202.99 | අනෙකුත් | |
| | 2202.99.30 | "ශක්ති ජනක පාන" ලෙස අලෙවි වන පාන වර්ග | ලීටරයකට රු. 12/- හෝ නිෂ්පාදිතයේ අඩංගු සීනි, මිලි ලීටර 100 කට ග්‍රෑම් 6 ක් ඉවත් කරමින්, ග්‍රෑමයකට ශත 30/- යන දෙකෙන් වැඩි අගය |
| | | පළතුරු හෝ එළවළු යුෂ පාදක කර ගත් පානයන්: | |
| | 2202.99.51 | මිලි ලීටර 100 ක අන්තර්ගත සීනි ප්‍රමාණය ග්‍රෑම් 6 ට වඩා වැඩි පානයන් | නිෂ්පාදිතයේ අඩංගු සීනි, මිලි ලීටර 100 කට ග්‍රෑම් 8 ක් ඉවත් කරමින්, ග්‍රෑමයකට ශත 30/- |
| | | අනෙකුත්: | |
| | 2202.99.91 | මිලි ලීටර 100 ක අන්තර්ගත සීනි ප්‍රමාණය ග්‍රෑම් 6 ට වඩා වැඩි පානයන් | නිෂ්පාදිතයේ අඩංගු සීනි, මිලි ලීටර 100 කට ග්‍රෑම් 8 ක් ඉවත් කරමින්, ග්‍රෑමයකට ශත 30/- |